# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 නොවැම්බර් මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.11.08 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව

"ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක     දරන ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අධ්‍යාපනය තුළින් නාවික ක්ෂේත්‍රය තුළ වෘත්තීය නිපුණතා ප්‍රවර්ධනය කිරීම;

(ආ) නාවික ව්‍යාපාරයේ නියැලී සිටින සහ නියැලීමට බලාපොරොත්තු වන පුද්ගලයන් දැනුම්වත් කිරීම;

(ඇ) නැව් ව්‍යාපාරය පිළිබඳ මනා අවබෝධයක් ඇති උගත් කාර්ය මණ්ඩලයක් යොදවා ගැනීමට ප්‍රධාන නැව් සමාගම්වල ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරින් පෙළඹවීම;

(ඈ) සංස්ථාවේ සාමාජිකත්වයට සාමාජිකයන් ඇතුළු කර ගැනීම, සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සහ නැව් ව්‍යාපාරය පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සහ නැව් ව්‍යාපාරය පිළිබඳ සුදුසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන් පුහුණු කිරීම, විධිමත් කිරීම, සංස්ථාවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යයන පාඨමාලා නියම කිරීම සහ අනුමත කිරීම, එවැනි පාඨමාලා සහ විභාග පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු යෙදීම සහ නැව් ව්‍යාපාර ක්ෂේත්‍රයේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා වූ පිළිගත් අධ්‍යාපනික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්, සංස්ථාවේ සාමාජිකයන්ගේ වෘත්තීය චර්යාවට අදාළ ප්‍රමිති නියම කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කරනු ලබන බවට වග බලා ගැනීම;

(ඊ) ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි සම්මන්ත්‍රණ, සම්මේලන, සමුළු, වැඩමුළු සහ රැස්වීම් සංවිධානය කිරීම සහ පැවැත්වීම;

(උ) සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය වන පැකේජ අලෙවි කිරීම සඳහා නැව් ආශ්‍රිත ව්‍යාපාර ඉලක්ක ගත කිරීම;

(ඌ) අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යයනයන් කිරීම, භාර ගැනීම, ඒවා වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම;

(එ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඇති මේ හා සමාන ආයතන සමග සහයෝගය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඒ) විභාග පැවැත්වීම හා සාමාජිකත්වය පිරිනැමීම;

(ඔ) නැව් හා භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් රජයට සහය වීම හා උපදෙස් ලබා දීම; සහ

(ඕ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන ආකාරයට පත් කරනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත මේ පනතේ විධිවිධානවලට හා තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත් කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු

කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) මේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට ඇතුළත් වීම;

(ඊ) විවිධ සාමාජිකයන්ගේ වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ රීති

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාම;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, මණ්ඩලයේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ මණ්ඩලයේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත්කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) මණ්ඩලයේ සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය;

(ඉ) සංස්ථාවේ හා මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනි ම රැස්වීමක දී කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විට ම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක වූ සංගමයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

ගාස්තු හා දායක මුදල් අයකර ගැනීමට ඇති බලය

7. මෙම සංස්ථාව විසින් පවත්වනු ලබන ඕනෑම ගාස්තු හා දායක මුදල් අය කිරීමට නීත්‍යානුකූල බලය හා හැකියාව තිබිය යුතු ය:—

(අ) සංස්ථාව විසින් පවත්වනු ලබන ඕනෑම විභාගයකට හෝ පාඨමාලාවකට ඇතුළත් වීම සඳහා සංස්ථාව විසින් සාධාරණ යයි සලකනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කිරීම;

(ආ) සංස්ථාවේ ඕනෑම සාමාජිකත්ව පන්තියකට ඇතුළත් කර ගැනීමට ගාස්තු ; සහ

(ඇ) සංස්ථාවේ සාමාජිකයන්ගෙන් අයකර ගැනීම උචිත යයි සංස්ථාව විසින් සලකනු ලබන දායක මුදල් සහ ගාස්තු.

සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන්

**8.** අවශ්‍යයැයි මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ නිල නාම ඔවුන්ට පැවරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ විගණනය හා ගිණුම්

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද, සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

සංගමය සංස්ථාව වෙත සතුවීම

**10.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට—

(අ) සංගමයට අයත්ව තිබූ චංචල හෝ නිශ්චල සියලු දේපළ ද;

(ආ) සංගමයේ සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ සංගමයේ සියලු බැරකම් ද; සහ

(ඇ) සංගමයේ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද,

සම්පූර්ණයෙන් සංස්ථාව වෙත සතු විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි—

(අ) සංගමයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය;

(ආ) සංගමයේ සියලු බැරකම්, සංස්ථාවේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) සංගමයේ සියලු නිලධරයන් සහ සේවකයන්, සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) පැවති සංගමයේ කාර්ය සඳහා ඇතුළත් වූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, සංස්ථාව විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඉ) විනිශ්චයට භාජනයව පැවතියා වූ සංගමය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇත්තා වූ ද සියලු නඩු හා නඩු කටයුතු, සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩු හා නඩු කටයුතු හෝ ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

**11.** ලේකම්වරයා හෝ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු හා මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධනපත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන්

ඔවුන් විසින් ඒ සාධනපත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම**

**12.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ**

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මඟින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

**අභිධාන පාවිච්චි කිරීමේ සුදුසුකම්**

**14.** (1) අවස්ථාවෝචිත පරිදි "වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ සාමාජික" සහ "වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ අධි සාමාජික" යන අභිධානය ලබා ගැනීමේ සහ භාවිත කිරීමේ ද, තම නාමයට පරව අවස්ථාවෝචිත පරිදි "එම්.අයි.සී.එස්." හෝ "එෆ්.අයි.සී.එස්." යන යෙදුම් පාවිච්චි කිරීමේ සහ "වරලත් නැව් තැරැව්කරුවකු" ලෙස සුදුසුකම් ලැබීමේ ද හිමිකම සෑම සාමාජිකයකුට ම ඇත්තේ ය.

(2) ඉහත සඳහන් පරිදි හැර යටකී අභිධානයක් හෝ යෙදුමක් කිසිදු කාර්යයක් සඳහා වුව ද කිසිදු තැනැත්තකු විසින් පාවිච්චි නොකළ යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

**සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස්**

**16.** මේ පනතින් හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.